**මොරටුව විශ්වවිද්‍යාලීය තාක්ෂණික ආයතනය - 2022**

**------------------------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මතය**

මොරටුව විශ්වවිද්‍යාලීය තාක්ෂණික ආයතනයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) උප වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආයතනය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය**

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

**1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

**1.6.1 ගෙවිය යුතු මුදල්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 දෙසැම්බර් 31 දිනට වර්ෂ 01ත් වර්ෂ 02 ත් අතර කාලයක් පවතින එකතුව රු.1,251,747 ක සහ වර්ෂ 02 ට වැඩි කාලයක සිට පවතින එකතුව රු. 4,967,589 ක ණයහිමි ශේෂ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | ණයහිමි ශේෂ නිරවුල් කිරීමට ආයතනය සතු ප්‍රමාණවත් මුදලක් නොමැති බව. | ප්‍රමාදයකින් තොරව ණයහිමියන්ට ගෙවීම් කිරීම සඳහා කටයුතු කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 18,959,131 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.24,900,166 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.5,941,035 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට රජයෙන් ලැබුණු පුනරාවර්තන ප්‍රදාන රු.51,733,000 කින් හා අනෙකුත් ආදායම් රු.7,599,668 කින් වැඩිවීමට සාපේක්ෂව පෞද්ගලික පඩිනඩි වියදම රු.45,070,187 කින්ද ඉහළ යාම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය**

ඉකුත් වර්ෂයේ රු.1,191,481,015 ක් වූ සමස්ථ ආදායම සමාලෝචිත වර්ෂයේදී රු.557,759,632 ක් දක්වා සියයට 52 කින් අඩු වී තිබුණි. එසේම ඉකුත් වර්ෂයේ වියදම රු.1,216,381,181 ක් වූ වියදම සමාලෝචිත වර්ෂයේදී රු.576,718,763 ක් එනම් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 52 කින් පහල ගොස් තිබුණි.

## 2.3 අනුපාත විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ ජංගම අනුපාතය 0.73 : 1 ක් හා ක්ෂණික අනුපාතය 0.64 :1 ක් වූ අතර ඉකුත් වර්ෂයේ එම අනුපාත පිළිවෙලින් 0.68 : 1 ක් හා 0.56 : 1 ක් වූයෙන් ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේදී ජංගම අනුපාතයේ වාසිදායක තත්ත්වය හා ක්ෂණික අනුපාතයේ අවාසිදායක තත්ත්වය වර්ධනය වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) තාක්ෂණික ආයතනය ස්ථාපිත ඉඩම පවරා ගැනීමට රු.25,000,000 ක් 2007 වර්ෂයේ දී ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවට ගෙවා තිබුණද, 2009 වර්ෂයේදී මෙම ඉඩමෙහි අයිතිය ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවෙන් බැහැර වී ඇති බැවින් ගෙවන ලද රු.25,000,000 ක අත්තිකාරම ආර්ථික නොවන වියදමක් වී තිබුණි. තවද මෙම ඉඩමෙහි නීත්‍යානුකූල අයිතිය සමාලෝචිත වර්ෂය අවසාන වන විටද ලබා ගැනීමට අපොහොසත් වී තිබුණි. | ඉතිරි මුදල් රජය මගින් ලබා දී නොමැති අතර ඉන් පසු උසස් අධ්‍යාපන අමාත්‍යාංශය හා අනෙකුත් බලය ලත් ආයතන මගින් තාක්ෂණික ආයතනය නැවත ස්ථාපනය නිම කොට ඇත. ඉඩමේ අයිතිය නිරවුල් කර දෙන ලෙස හෝමාගම ප්‍රාදේශීය ලේකම් වෙත 2022.02.02 හා 2022.05.06 දිනැති ලිපි මගින් ඉල්ලා ඇත. අදාල සියලු පාර්ශව සමග සාකච්ඡාවක් 2022.03.03 පවත්වන ලද අතර අදාල කටයුතු නිම කල ආයතනය වෙත අයිතිය පවරන ලෙස දන්වමින් 2023.03.13 දින නැවත ඉල්ලීමක් කර ඇති බව. | ඉඩමෙහි නීත්‍යානුකූල අයිතිය කඩිනමින් ලබා ගැනීමට කටයුතු කල යුතුය. |
| (ආ) අරමුදල් 07 ක පවතින එකතුව රු.24,711,780 ක් වර්ෂ 01 සිට වර්ෂ11 දක්වා කාලයක් අදාළ අරමුණු වෙනුවෙන් භාවිතා කර නොතිබුණි. | මෙම කාලය තුළ අදාල අරමුදල් භාවිතා කිරීමට අදාල අංශ වලින් ඉල්ලීම් නොලැබුණු අතර පිහිටුවා ඇති කර්තව්‍යයෙන් බැහැරව ඒවා භාවිතා කල නොහැකි බැවින් එසේ පවතින බව. | අරමුදල් භාවිතය පිලිබඳ කොන්දේසි කාලීනව සමාලෝචනය කර උපයෝජනය නොකරන අරමුදල් ප්‍රයෝජනයට ගැනීමට පියවර ගත යුතුය. |

### 3.2 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ)තාක්ෂණ ආයතනය නැවත ස්ථානගත කිරිම හා සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ 2017 ඉදිකිරීම් නිමකර භාරදුන් රු.8,821,053,785 ක් වටිනා ගොඩනැගිලි වටිනාකම තුල වූ ශිෂ්‍ය නේවාසිකාගාර ගොඩනැගිලි 02 හි කාමර 26 බැගින් වූ මහල් 02 ක් ඉදිකිරීමත්, ඉදිකල මහල් දෙකක කාමර වෙන් කිරිමත්, එම ගොඩනැගිලි 02 හි වහලවල් | අදාල නේවාසිකාගාර ගොඩනැගිලි සංකීර්ණයේ අසම්පූර්ණ ඉදිකිරීම් (G සහ H නේවාසිකාගාර) 2020.12.01 දින ආයතනයේ සැලසුම් හා සංවර්ධන කමිටුව විසින් එවකට සිටි නිසි බලධාරී වෙත දැනුම් දෙන ලදි. නිසි බලධාරී විසින් ඒ බව කොන්ත්‍රත්කරු වෙත දැනුම් දී තිබුණද | නිමකර නොමැති ඉදිකිරීම් කඩිනමින් අවසන්කර ආයතනයේ ප්‍රයෝජනයට ගැනීමට පියවර ගත යුතුය. |

| | | |
|---|---|---|
| ඉදිකිරීමත් සම්පූර්ණයෙන්ම අතහැර දමා තිබුණි. ඉහත කාමර සඳහා සැපයීමට නියමිතව තිබුණු ලී බඩු උපකරණ ද සැපයීමකින් තොරව හිටපු තාක්ෂණ ආයතනයේ හා ව්‍යාපෘතියේ අධ්‍යක්ෂ විසින් නිමකල ගොඩනැගිලි ලෙස 2017 වර්ෂයේදී ඉදිකිරීම් ආයතනය වෙත බාරගැනීමේ සහතික නිකුත් කර ගොඩනැගිලි බාරගෙන තිබුණි. ගොඩනැගිලි ආයතනයට භාරගත් 2017 වර්ෂයේ සිට 2023 වර්ෂයේ පෙබරවාරි දක්වාම එම ගොඩනැගිලිවල වහලයන් ඉදිකර නොතිබුණු බැවින් දීර්ඝ කාලයක සිට කාලගුණික තත්ත්වයන්ට මුහුණදීම හේතුවෙන් ගොඩනැගිලිවල අනෙකුත් ව්‍යුහමය කොටස් වලටද හානි සිදුවීමේ අවදානමක් පැවතුණි. | කොන්ත්‍රාත්කරු විසින් ඒ සම්බන්ධව කිසිදු පිලිතුරක් ලබා නොදෙන ලදි. මේ සම්බන්ධයෙන් ආයතන මට්ටමෙන් ගතහැකි පියවරක් සොයා බැලීමට කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකත්වයෙන් යුතු කමිටුවක් ද පත් කර ඇති බව. | |

**3.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පාඨමාලා සඳහා ශිෂ්‍යයින් තෝරා ගැනීම හා යෝග්‍යතා පරීක්ෂණ වෙනුවෙන් ගාස්තු ගෙවීම සඳහා විධිමත් ක්‍රමයක් සකස්කර අනුමැතිය ලබා නොගෙන ස්වයං මූල්‍යයන ක්‍රියාකාරකම් සඳහා 2016 මාර්තු 01 දිනැති අංක 04/2016 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව නිකුත් කරන ලද චක්‍රලේඛය ප්‍රකාරව පාඨමාලා ඉල්ලුම්පත් ආදායම අඛණ්ඩව සේවකයින් අතර බෙදාහැර තිබුණි. තවද 2020 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා කාලපරිච්ඡේදයට අදාලව ලැබුණු ඉල්ලුම්පත් ආදායමෙන් රු.6,195,437 ක් බෙදා හැරීම සඳහා ජංගම බැරකම්වල දක්වා තිබුණි. | අයදුම් කරන සිසුන් 4500 කින් පමණ සුදුසු අයදුම්කරුවන් තෝරා ගැනීම මාස කිහිපයක් තුල දී නිම කල යුතුව ඇත. මෙකී අමතර සේවා සඳහා වන ගෙවීම් වලට අදාල මුදල් පමණක් ජංගම වගකීම් වල දක්වා ඇත. මෙය කිසි සේත්ම ස්වයං මූල්‍යනන කටයුත්තක් ලෙස හඳුනාගෙන නොමැති අතර එහි විවිධ අරමුදල් සඳහා (උදා-: අධ්‍යක්ෂක අරමුදල්) වෙන්කිරීම් වලට පමණක් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 04/2016 හි ප්‍රතිශත යොදාගෙන ඇති බව. | ස්වයං මූල්‍යයන කටයුතු සඳහාවූ මාර්ගෝපදේශ චක්‍රලේඛ අංක 04/2016 ප්‍රකාරව අමතර කාලය කැපකරන අය නිශ්චිතව හඳුනාගෙන ඒ සඳහා විශේෂ ගෙවීම් ක්‍රමයක් සකස්කර ගත යුතුය. |

**3.4 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පිරිවැය රු.205,322,908 ක්වූ සාප්පු සංකීර්ණයක් හා ආගන්තුක නිවාසයක් 2017 දී ඉදිකර තිබුණු අතර සාප්පු සංකීර්ණයේ කඩකාමර 13 න් 05 ක් 2018 වර්ෂයේ සිට කුලියට ලබාදීමට නොහැකි වී තිබුණි. | විවිධ ක්‍රම මගින් අයදුම්කරුවන් උනන්දු කලද පිහිටි ස්ථානයේ හේතුන්, කොවිඩ්-19 වසංගත තත්වය මෙන්ම ආර්ථික අර්බුදය හේතුවෙන් කඩකාමර ගැනුම්කරුවන් ඉදිරිපත් නොවීය. ඉදිරිපත් වූ ගැණුම්කරුවන්ද ආර්ථික ප්‍රතිලාභ නොවන බව දක්වමින් ඉවත් වෙමින් පවතී. කඩ කාමර සඳහා සුදුසු අයදුම්කරුවන් සොයා ගැනීමට ආයතනය දිගින් දිගටම කටයුතු කරමින් පවතින බව. | ඌන උපයෝජිත වත්කම් උපයෝජනය සඳහා කඩිනම් ක්‍රියාමාර්ග ගතයුතුය. |

**3.5 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 දෙසැම්බර් 31 දිනට අනුමත අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පවතින පුරප්පාඩු 14 සම්පූර්ණ කර නොගෙන සමාලෝචිත වර්ෂයේදී බාහිර කතිකාචාර්යවරුන් 94 ක් බඳවා ගෙන දේශන ගාස්තු ලෙස රු.9,297,282 ක් ගෙවා තිබුණි. | අමතර කාර්ය මණ්ඩල ලබාදිය යුතු බවට පාලක සභාවේ මෙන්ම විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය රජය වෙත ඉදිරිපත් කර ඇත. රජයේ ප්‍රතිපත්තිය අනුව සේවකයින් බඳවා ගැනීමට නොහැකි නිසා අධ්‍යයන කටයුතු පවත්වා ගෙන යාමට බාහිර කථිකාචාර්යවරුන් යොදවනු ලබයි. ඔවුන් සේවය කල පැය ගණන පදනම්ව එකී ගෙවීම් සිදුකර ඇත. පුරප්පාඩු පිරවීමට අවසරයක් ලැබෙන්නේ නම් බාහිර කථිකාචාර්යවරුන් සඳහා වන වියදම අඩු කර ගතහැකිව ඇත. | අවශ්‍යතාවයට ගැලපෙන ආකාරයට අනුමත කාර්ය මණ්ඩලය සංශෝධනය කර පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට පියවර ගතයුතුය. |